# මහාගෝපාලක සූත්‍රයෙන් හෙළිවන භික්ෂුවගේ කාර්යභාරය

*- වරදිවෙල විජයසුමන හිමි -*

**පිවිසීම** - බුදුසමය ප්‍රකට කරන පරමාදර්ශී සමාජය භික්ෂූන්ගෙන් සමන්විත සංඝ සමාජයයි. භික්ෂුව පරමාදර්ශී සමාජය නියෝජනය කරන්නෙකු වන හෙයින් භික්ෂු ජීවිතය උදාර ගුණ ධර්මයන්හි ප්‍රතිමූර්තියක් විය යුතුය. සමස්ත සමාජය වෙත සපයන ආදර්ශය, ශික්ෂා සංවරය, ඉන්ද්‍රිය දමනය, ආජීව පාරිශුද්ධිය, අල්පේච්ඡතාව, සන්තුෂ්ටිතාව වැනි ගුණධර්මයන්ගෙන් පෝෂිත වූවක් විය යුතුවේ. මෙම ගුණධර්ම වර්ධනය කරගැනීම සඳහා භික්‍ෂු සමාජයට මාර්ගෝපදේශකත්වය සපයන සූත්‍ර දේශනා අතර මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයේ මහාගෝපාලක සූත්‍රය වැදගත් ස්ථානයක් හිමි කරගනී.[1]

## සූත්‍රයෙහි සාරාංශය

මහාගෝපාලක සූත්‍රය ආරම්භ වන්නේ ගොපල්ලෙකුගේ චර්යා රටාව උදාහරණ ලෙස දැක්වීමෙනි. ගවරැළක් පාලනයෙහි නියුතු ගොපල්ලෙකු සතුව පවතින අයහපත් චර්යා රටාව නිසා ඔහු ඒ සඳහා

---

[1] ම.නි. I, මහාගෝපාලක සූත්‍රය, පිටු 526-534

0 2 MAY 2012

නුසුදුසු අයකු බවට පත්වන ආකාරය පළමුව විස්තර කෙරේ දෙවනුව විස්තර කෙරෙනුයේ ගවරැළ පාලනයට නුසුදුසු ගොපල්ලා මෙන්ම ශාසනික චර්යාවෙහි නියැලෙන භික්ෂුව ඒ සඳහා අයෝග්‍ය භාවයට පත්වන ආකාරයයි. ශාසනික චර්යාවෙහි යහපත් ලෙස නිරතවෙමින් ඒ සඳහා සුදුස්සෙකු වන භික්ෂුව පිළිබඳව කරුණු දැක්වීම මෙම සූත්‍ර දේශනාවෙහි ප්‍රස්තුතය වේ.

**අයහපත් ගොපල්ලාගේ ස්වභාවය.**

ගොපල්ලාගේ වගකීම වන්නේ තමන් විසින් පාලනය කරන ගවරැළ හා අදාළ කාර්යයන්හි උචිත පරිදි නිරත වෙමින්, ගවරැළෙහි ආරක්ෂාව හා දියුණුව උදෙසා කටයුතු කිරීමයි. ඒ සඳහා ගවපාලනය පිළිබඳව සියලු කාර්යයන්හි ඔහු දක්ෂයකු විය යුතුය. එසේ නොවන්නේ නම් ඔහු එම කාර්යයෙහි නිරතවීමට සුදුස්සෙකු නොවන්නේය. ගෙපල්ලා සිය කාර්යයෙහි අසමර්ථතා ප්‍රකට කරන ලක්ෂණ එකොළොසකි. එම ලක්ෂණ මෙසේ විස්තර කළ හැකිය.[2]

ගොපල්ලා තම ගවරැළෙහි සිටින ගවයන් සංඛ්‍යාත්මකව කෙතෙක්දැයි දැන සිටිය යුතුය. ඒ ඒ වර්ණ සහිත ගවයන් සංඛ්‍යාව ද දත යුතුය. ඒ අනුව සංඛ්‍යාත්මකව හෝ වර්ණ වශයෙන් හෝ සිය ගවරැළ පිළිබඳව දැනුම ගොපල්ලා සතුවීම අනිවාර්ය වේ. එවැනි දැනුමක් නොමැති ගොපල්ලා සිය කාර්යයෙහි දක්ෂයෙකු බවට පත් නොවේ. මෙම ගොපල්ලා සිය ගවරැළෙන් ගවයන් පැහැර ගත් බව මෙන්ම, වෙනත් ගවරැළකින් තම රැළට එක්වූ ගවයන් ගැන ද නොදනී.

[2] ඉධ භික්ඛවෙ ගොපාලකො න රූපඤ්ඤු හොති, න ලක්ඛණ කුසලො හොති, න ආසාටිකං සාටෙතා හොති, න වණං පටිච්ඡාදෙතා හොති, න ධූමං කත්තා හොති, න තිත්ථං ජානාති, න වීථිං ජානාති, න ගොචර කුසලො හොති, අනවසෙස දොහී ච හොති, යෙ තෙ උසභා ගොපිතරො ගො පරිණායකො තෙන අතිරෙක පූජාය පූජෙතා හොති - එම-



ඔහුගේ නැති වූ ගවයන් නැතිවූවන්ම වන අතර, වෙනත් රංචුවලට අයත් ගවයින් ගෙන ඔහු හැසිරේ. පසුව පැමිණෙන අන් ගව හිමියන් ඔවුන් රැගෙන යන අතර ඔහුගේ ගව පට්ටිය පිරිහේ. ඔහු ගව පට්ටියෙන් ලබන ලාභය ද පිරිහේ.[3]

ගොපල්ලා තමාගේ ගව රංචුවේ සිටින ගවයන්ගේ සිරුරෙහි හංවඩු ගැසූ ලකුණු දත යුතුය. (ලක්ඛණ කුසලො) දුනු, ත්‍රිශූල ආදී වශයෙන් හංවඩු ගසා ඇති ලකුණු නොදැනීම පිහිරීමට හේතුවකි.[4] තම ගව රංචුවේ සිටින ගවයන් පැහැරගත් විට හෝ පලාගිය විට අසවල් ලකුණු ඇති ගවයන් නැතැයි දැන ගැනීමට මෙම ලකුණු උපකාරී වේ. ගව රැළෙහි දක්ෂ අදක්ෂ ගවයන් හඳුනාගැනීමට ද මෙම ලකුණු උපකාරී වේ.

ගවයන් වනයෙහි හැසිරෙන විට නොයෙක් ආකාරයේ තුවාල ආදිය ඇතිවේ. කුර දණිස් ආදිය වණ වේ. එහි නිල මැස්සෝ ඉඟද තබති. එකී නිලමැස්සන් ඉවත් කොට එම තුවාල සුවවීම සඳහා ඉඟද ඉවත් කළ යුතුය. ඇතැම් ගොපල්ලෝ එසේ නොකරති. (න අසාටිකං සාටෙන්ති) එසේ පිළියම් නොයෙදීම නිසා ගවයන් මරණයට පවා පත්විය හැකිය. එම ස්වභාවය ගවරංචුවේ පිරිහීමකි. එසේම ගොපල්ලාගේ ද පිරිහීමකි.[5]

[3] න රූපඤ්ඤු හොතීති, ගණනතො වා වණ්ණතො වා රූපං න ජානාති, ගණනතො න ජානාති නාම අත්තනො ගුන්නං සතං වා සහස්සංවාති සංඛං න ජානාති, සො ගාවිසු හටා වා ළාතාසු වා ගො ගණං ගහෙත්‍වා අජ්ජ එත්තිකා න දිස්සන්තිති.........
ම.නි. අට්ඨකථා, II හේ.මු. 1943 පිටුව 215

[4] න ලක්ඛණ කුසලො ති ගාවීනං සරීරෙ කතං ධනුසත්ති තිසුලාදි භෙද ලක්ඛණං න ජානාති, සො ගාවීසු හටාසු වා ළාසු වා අජ්ජ අසුක ලක්ඛණංච අසුක ලක්ඛණංච න දිස්සන්තීති. -එම-

[5] න අසාටිකං සාටෙතාති ගුන්නං ඛාණු කණ්ණකාදීහි පහට්ඨානෙසු වණෙ හොති. තත්‍ථ නීල මක්ඛිකා අණ්ඩකානි ඨපෙන්ති. තෙසං ආසාටිකාති නාම, තානි දණ්ඩකෙන අපනාමෙත්‍වා භෙසජ්ජං දාතබ්බං හොති. -එම-

02 MAY 2012